සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

52302

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

21 - 11 - 2016

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

නම :- .................................................... විභාග අංකය :- ........................

Learning Resource Center
R
De Mazenod College
Kandana

සැලකිය යුතුයි:
- පළමු කොටසේ සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- දෙවැනි කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු සපයා පළමු කොටසට අමුණා බාර දෙන්න

## I - කොටස

- අංක 1 - 5 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) සූර්යයාගේ සිට පෘථිවියට ඇති මධ්‍ය දුර,

(1) කි.මී. මිලියන 149.6 කි. (2) කි.මී. මිලියන 147.2 කි.
(3) කි.මී. මිලියන 152.1 කි. (4) කි.මී. මිලියන 160 කි.

(02) ආසියාතු ප්‍රදේශයේ දක්නට ලැබෙන ගංගා පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) යැංසිකියැං, ඇමර්සන්, හොවැංහෝ (2) සින්දු, හොවැංහෝ, යැසිකියැං
(3) හොවැංහෝ, යැසිකියැං, නයිල් (4) මරේඩාලිං, ඇමර්සන්, කොංගෝ

(03) මහවැලි කලාපයට අයත් දිස්ත්‍රික්ක ඇතුළත් පිළිතුර වන්නේ,

(1) කොළඹ, ගම්පහ, කළුතර
(2) ගාල්ල. මාතර, හම්බන්තොට
(3) අනුරාධපුරය, පොළොන්නරුව, මාතලේ
(4) රත්නපුරය, කොළඹ, කෑගල්ල

(04) "පොළොව පවතින තෙක්, වැපිරීම හා කැපීම ද, ශීත හා උණුසුමද , සිසිර හා ගිම්හානය ද, රාත්‍රිය හා දවාල ද නොකඩවා පවතිනු ඇතැයි" සඳහන්ව ඇත්තේ,

(1) බුදු දහමේ ය. (2) ෂින්ටෝ දහමේ ය.
(3) ක්‍රිස්තියානි ආගමේ ය. (4) හින්දු ආගමේ ය.

(05) භූ ලක්ෂණ සිතියමක භෞතික ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) කඳුවැටිය, පළාත් මායිම, දළ බෑවුම
(2) දළ බෑවුම, මඳ බෑවුම, කොත් කන්ද
(3) දිස්ත්‍රික් මායිම, වෙනත් වගාවන්, නිම්නය
(4) නිම්නය, කඳුවැටිය, වෙනත් වගාවන්

- අංක 6 සිට 10 දක්වා ප්‍රකාශන නිවැරදි නම් "නි" යන්න වටා ද, වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.

(06) ඕසෝන් වායුවෙන් 90%ක්ම පවතින්නේ අපරිවර්තී ගෝලය තුළ ය. (නි / වැ)

(07) ආසියානු ප්‍රදේශයට අයත් මුහුදු තීරය දළ වශයෙන් $62000km^2$ පමණ වේ. (නි / වැ)

(08) නැගෙනහිර ප්‍රදේශයට බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක අයත් වේ. (නි / වැ)

(09) ආසියාව යුරෝපයෙන් වෙන් වන්නේ යූරල් කඳුවැටියෙන් ය. (නි / වැ)

(10) සිතියමක දක්වෙන ඕනෑම ස්ථාන දෙකක් අතර සැබෑ දුර සොයා ගැනීමට දිශාව උපකාරී වේ. (නි / වැ)

- අංක 11 සිට 15 දක්වා වගන්තිවලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.
(අඟහරු ග්‍රහයා, නිල් ග්‍රහයා, අරාබි මුහුද, මළ මුහුද, හිරුදෙවියා, අහසේ දෙවඟන, සැබෑ උතුර, චුම්බක උතුර)

(11) දනට සොයාගෙන ඇති ජීවය පවතින එකම ග්‍රහයා .................................................... වේ.

(12) ලෝකයේ ගොඩබිම ගැඹුරුම ස්ථානය වන ..................................... ආසියානු භූමි ප්‍රදේශයේ පිහිටා ඇත.

(13) බෙංගාල බොක්ක හා ......................... ආසන්නව තෙල් සම්පත් බහුලව ඇති බවට විශ්වාස කරයි.

(14) ඊජිප්තු වැසියන්ගේ වන්දනාවට ලක්වූ ස්වාභාවික වස්තුවක් ලෙස .................................. නොහොත් ආටේන් හැඳින්විය හැකි ය.

(15) 1 : 50000 භූ ලක්ෂණ සිතියම්වල T.N. අක්ෂරවලින් ......................................... දක්වනු ලබයි.

- අංක 16 සිට 20 දක්වා "අ" තීරුව හා ගැළපෙන පිළිතුර "ආ" තීරුවෙන් තෝරා යා කරන්න.

| (අ) | (ආ) |
|---|---|
| (16) ඕසෝන් ස්තරය ආරක්ෂා කිරීම | A. රියෝ සම්මුතිය |
| (17) ගෝලීය ජෛව විවිධත්වය සුරැකීම | B. ආසියාන් සංවිධානය |
| (18) කලාපයේ සාමය හා ස්ථාවරභාවය තහවුරු කිරීම | C. මොන්ට්‍රියල් සම්මුතිය |
| (19) කඳුවැටි විහිදෙන දිශාවට සමාන්තරව විහිදෙන නිම්නය | D. ආයතගාමී නිම්නය |
| (20) කඳුවැටි විහිදෙන දිශාවට ප්‍රතිවිරුද්ධව විහිදෙන නිම්නය | E. තීර්යක් නිම්නය |
| | F. සාර්ක් සංවිධානය |

(ලකුණු 2 × 20 = 40)

## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.

(01) තුන්වන වාරයට නියමිත ඇගයීම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ විසින් ඇගයීම සඳහා සිදුකරන ලද ක්‍රියාකාරකම කුමක් ද? (ලකුණු 02)

(ii) ඉහත ක්‍රියාකාරකමට පාදක වූ පාඩම් ඒකකය කුමක් ද? (ලකුණු 02)

(iii) ඔබ විසින් ඒ සඳහා යොදන ලද මාතෘකාව ලියා දක්වන්න. (ලකුණු 02)

(iv) එම ක්‍රියාකාරකම සඳහා යොදාගත් මූලාශ්‍ර හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(v) ඉහත ක්‍රියාකාරකමට සහභාගීවීමෙන් ඔබේ කණ්ඩායමට ලැබුණු අත්දැකීම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)


(vi) මෙම ක්‍රියාකාරකම සාර්ථක කරගැනීමට ගුරුතුමිය හෝ ගුරුතුමා ලබාදුන් උපදෙස් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(02) (i) නිල් ග්‍රහයාගේ වායුගෝලය ප්‍රධාන ස්තර හතරකින් සමන්විත වේ. ඉන් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) ශිලාගෝලයේ දැකගත හැකි භෞතික ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ජලය හිඟවීම නිසා ඇතිවිය හැකි ගැටලු තුනක් සඳහන් කර ඉන් එක් ගැටලුවක් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) පහත සිතියමේ A හා B අක්ෂරවලින් දක්වා ඇති ප්‍රදේශයේ පිහිටි මධ්‍යම ආසියානු රටවල් එකක් හා නැගෙනහිර ආසියානු රටවල් එකක් නම් කරන්න. (ලකුණු 02)




(ii) මුහුදු හා විල්වලින් මිනිසාට ලැබී ඇති ප්‍රයෝජන හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ආසියානු ප්‍රදේශයේ දැකගත හැකි දේශගුණ වර්ග දෙකක් නම්කර, ඉන් එක් දේශගුණ වර්ගයක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) කොළඹ පුරවර ප්‍රදේශයට අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) කොළඹ පුරවර ප්‍රදේශයේ දැකගත හැකි සුවිශේෂී ලක්ෂණ හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) කොළඹ පුරවර ප්‍රදේශය වර්තමානයේ දී මුහුණ දී ඇති ගැටලු තුනක් නම් කර ඉන් එක් ගැටලුවක් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) "ආදි මිනිසා පරිසරය ප්‍රයෝජනයට ගෙන ඇති ආකාරය යුගයෙන් යුගයට වෙනස් වී ඇත." මෙම ක්‍රියාවලියේ විකාශන අවස්ථා දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සෘජුව හෝ වක්‍රව ඇතිවන පාරිසරික ගැටලු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පරිසර තුලිතතාව ආරක්ෂා කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) 1 : 50 000 භූ ලක්ෂණ සිතියමක දක්නට ලැබෙන ජලවහන රටා දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) භූ ලක්ෂණ සිතියමක දැකගත හැකි මානුෂ භූ දර්ශනයේ ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) 1 : 50 000 මෙට්‍රික් සිතියම්වල ඇති පහත සඳහන් සම්මත සලකුණු නියමිත වර්ණ හා සංකේත භාවිතා කර ඇඳ දක්වන්න.

A. පාසල
B. රෝහල
C. ප්‍රධාන තැපැල් කාර්යාලය
D. මුස්ලිම් පල්ලිය
E. වගුරු බිම (ලකුණු 05)

(07) (i) "ජලය යනු ජීවයේ පදනමයි" පෘථිවියේ ජලය පවත්නා ස්වරූප දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) මිනිසා ගොඩබිම ආශ්‍රිත ජලයෙන් ලබාගන්නා ප්‍රයෝජන හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ජල දූෂණයට බලපාන ප්‍රබල සාධක දෙකක් දක්වා ඉන් එක් සාධකයක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)